අලුත්ගම ප්‍රදේශයේ 23 හැවිරිදි තරුණියක පැහැරගෙන යාමේ සිදුවීමකට, පුද්ගලයින් තිදෙනෙකු පොලීසිය විසින් අත්අඩංගුවට ගත් බව මාධ්‍ය වාර්තා කරයි.

මෙම සිදුවීම පුවත් වාර්තාවන් දෙකක් (ඔක්. 14, 2022) වාර්තා කරන්නේ මෙසේයි:

අද - "23 හැවිරිදි තරුණියක පැහැර ගත්තැයි තිදෙනෙකු අත්අඩංගුවට"
දිවයින- "ප්‍රේම දඩයමට තරුණිය පැහැරගත් සිව්දෙනා මාට්ටු"

1) මෙවැනි අපරාධකාරී ක්‍රියාවක් "ප්‍රේමය නිසා" සිදුකළ බවට භාවාතිශය ලෙසින් දැක්වීම, එම අපරාධය සැහැල්ලු කොට දැක්වීමක් යැයි ඔබ නොසිතන්නේ ද? ඒ ඔස්සේ විශේෂයෙන්ම කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ සාමාන්‍යකරණය වීමට ඉඩක් නොතිබෙන්නේ ද?

2) එසේ නම්, මෙම පුවත් දෙකෙන්, වඩාත් යෝග්‍ය පුවත ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?